# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2021 ජූලි මස 16 වන දින

II වන කොටස

අතිරේකය

(2021.07.19 දින නිකුත් කරන ලදී)

# දක්ෂිණ ලංකා තෘතීයික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨය (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

**දක්ෂිණ ලංකා තෘතීයික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බුද්ධික පතිරණ මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 17.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# දක්ෂිණ ලංකා තෘතීයික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨය (සංස්ථාගත කීරීමේ)

## දක්ෂිණ ලංකා තෘතීයික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

**පූර්විකාව**

"දක්ෂිණ ලංකා තෘතීයික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨය" යනුවෙන් හඳුන්වනු ලබන හා ප්‍රකට පීඨයක්, එකී පීඨයේ සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුකූලව, එකී පීඨයේ සියලු පරමාර්ථ හා එම පීඨය හා සම්බන්ධ සියලු කාරණා සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා ගෙන තිබූ හෙයින් ද :

එකී පීඨය පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, එම පරමාර්ථ හා කාරණා එකී පීඨය විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් සහ එකී පීඨය සංස්ථාගත කරවා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය**

1. මේ පනත 2021 අංක   දරන දක්ෂිණ ලංකා තෘතීයික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**දක්ෂිණ ලංකා තෘතීයික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨය සංස්ථාගත කිරීම**

2. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "පීඨය" යනුවෙන් සඳහන් කරනු ලබන) දක්ෂිණ ලංකා තෘතීයික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කර ගනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් සඳහන් කරනු ලබන) "දක්ෂිණ ලංකා තෘතීයික අධ්‍යාපන" හා නායකත්ව පුහුණු පීඨය යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය භාවිතා කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කීරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. තව ද එකී සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

## දක්ෂිණ ලංකා තෘතීයික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨය (සංස්ථාගත කිරීමේ)

සංස්ථාවේ පොදු පරමාර්ථ

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලැබුවේ යම් පොදු පරමාර්ථ සඳහා ද එම පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ :—

(අ) ජනයාගේ බුද්ධි වර්ධනයට අදාළ වූ ශාස්ත්‍රීය දේශන, සම්මන්ත්‍රණ, විධායක ක්‍රියාකාරී මග පෙන්වීම, අදාළ වූ ප්‍රදර්ශන හා අධ්‍යාපනික, ප්‍රචාරක කටයුතු සංවිධානය කිරීම;

(ආ) පුස්තකාල පහසුකම් ඇති කිරීම හා සියලුම ආකාරයේ ජනසන්නිවේදන (රූපවාහිනී, ගුවන් විදුලි, අන්තර්ජාල, පුවත්පත් හා ප්‍රකාශන) ක්ෂේත්‍රයට අදාළ පුහුණු වැඩසටහන් සහ එවැනි ඒකක පවත්වා ගෙන යාම;

(ඇ) ග්‍රාමීය, දිස්ත්‍රික් සහ පළාත් මට්ටම්වල ශිෂ්‍යයන්ගේ හා තරුණයන්ගේ ක්‍රීඩා, සාහිත්‍යය හා කලා වැනි ක්ෂේත්‍රයන්හි සහජ හැකියාවක් හඳුනාගැනීම සහ ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සකස් කරදීම මගින් ඔවුන්ගේ සහජ හැකියාවන් වැඩිදියුණු කර ගැනීම සඳහා දිරි ගැන්වීම;

(ඈ) පාසල් හැර යන තරුණ පිරිස් සඳහා සුදුසු ව්‍යාපෘති හඳුනා ගැනීම සහ අනාගත රැකියා අවස්ථාවන් සඳහා ඇතිවන තරගකාරී ඉල්ලුමට මුහුණ දීම සඳහා පුහුණු කිරීමේ අරමුණින් යුතුව එවැනි ව්‍යාපෘති පවත්වාගෙන යාම මගින් ඔවුන්ට සහාය වීම;

(ඉ) දුම්කොළ, මධ්‍යසාර සහ මත්ද්‍රව්‍යවලින් තොර සමාජයක් ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවීම සහ එමගින් සෞඛ්‍යසම්පන්න, විනයවත් දේශානුරාගයෙන් සහ මානව දයාවෙන් යුත් පරම්පරාවක් බිහි කිරීම;

(ඊ) පරිසර සංරක්ෂණය හා තුලනාත්මක සංවර්ධනය සඳහා සක්‍රීය ක්‍රියාමාර්ග ගැනීම;

(උ) ගොවීන් හා ධීවරයින් දිරිගැන්වීම සහ තරුණ ගොවි හා ධීවර සංවිධාන ඇති කිරීම;

(ඌ) පොදු ජන සුබසාධනයට සහ හදිසි ආපදා, ජාතික ව්‍යසනයන්හි දී තරුණ හා වැඩිහිටි ශ්‍රමය යොමු කිරීම;

(එ) ශ්‍රී ලංකාවේ සිංහල, දෙමළ, මුස්ලිම් සහ බර්ගර් ජනතාව අතර සාමය හා එකමුතුකම ගොඩනැගීම සඳහා පුද්ගලයන් අතර අන්‍යෝන්‍ය අවබෝධය ද, ජාතික සවිඥානකත්වය පිළිබඳ හැඟීම වර්ධනය කිරීම පිණිස ද, හොඳහිත සහ මිත්‍රත්වය අභිවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඒ) ආගමික, සංස්කෘතික, සමාජයීය හා ආර්ථික අන්තර් ක්‍රියාකාරිත්වය තුළින් ශ්‍රී ලාංකීය ජනතාව තුළ ආගමික සුසංගමය, අන්‍යෝන්‍ය අවබෝධය, සාමකාමී සහජීවනය, ආධ්‍යාත්මික සංවර්ධනය සහ මිත්‍රත්වය ප්‍රවර්ධනය කිරීම;

(ඔ) යටිතල පහසුකම් පිළිබඳ අඩුලුහුඬුකම් සඳහා විසඳුම් සොයා ගැනීමට ජනතාව ස්වේච්ඡා ක්‍රියාකාරකම්වල යෙදවීම සඳහා පිරිස් සංවිධානය කිරීම සහ මෙහෙයවීම;

(ඕ) ශ්‍රී ලංකාව සහ වෙනත් රටවල් අතර අවබෝධය සහ මිත්‍රශීලීත්වය ගොඩනැගීමේ අරමුණින් සමාන අරමුණු ඇති අනෙකුත් අන්තර්ජාතික සංවිධාන සමග කණ්ඩායම් හුවමාරු කිරීම;

(ක) ශ්‍රී ලංකාව තුළ ජාතික ඒකාග්‍රතාවය සහ සාමය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මෙම පීඨය යටතේ සියලුම පිරිස් රැස්කොට ඒකරාශී කිරීම; සහ

(ග) ඉහත සඳහන් පරමාර්ථ මුදුන්පත් කරගැනීම සඳහා අවශ්‍ය හිතකර හෝ ආනුෂංගික විය හැකි වෙනත් සියලු කටයුතු සහ ක්‍රියාමාර්ග ගැනීමට.

සංස්ථාවේ බලතල

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට–

(අ) බැංකු ගිණුම් ආරම්භ කිරීමට, පවත්වාගෙන යාමට සහ වැසීමට ද;

(ආ) පරිත්‍යාගයන් සහ ප්‍රදානයන් එකතු කිරීමට හෝ භාර ගැනීමට සහ ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට ද;

(ඇ) කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකට, සංස්ථාවේ අරමුණු සඳහා වහාම අවශ්‍ය නොවන සංස්ථාවේ කිසියම් අරමුදල් ආයෝජනය කිරීමට ද;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ චංචල හෝ නිශ්චල දේපළ මිලට ගැනීමට, අත්කර ගැනීමට, බදු දීමට හෝ කුලියට දීමට, විකිණීමට හෝ අන්‍යාකාරයකින් ලබා ගැනීමට සහ තත්කාර්ය සඳහා නීත්‍යානුකූලව අත් කර ගැනීමට ද, සංස්ථාවේ පරමාර්ථ නංවාලීමේ අරමුණ ඇතිව අවස්ථානුකූල යැයි පෙනී යන විට ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට හෝ බැහැර කිරීමට ද;

(ඉ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකිවන ආකාරයෙන් සේවකයන් පත් කිරීමට, සේවයේ යෙදවීමට සහ පහකිරීමට සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන ආකාරයට ඔවුන් හට අදාළ පාරිශ්‍රමික ගෙවීමට ද;

(ඊ) සංස්ථාවෙහි බලතල ක්‍රියාත්මක කිරීමේ හෝ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි සංස්ථාව වෙනුවෙන් කටයුතු කිරීමට බලය ලබා දී ඇති යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු තුළින් හෝ සෘජුවම හෝ එවැනි ගිවිසුම් හෝ එකඟතාවලට ඇතුළුවීමට, ඉටු කිරීමට හෝ ක්‍රියාවට නැංවීමට ද; සහ

(උ) කළමනාකරණ කමිටුව තීරණය කරනු ලැබිය හැකි පරිදි සංස්ථාවෙහි ඕනෑම කටයුත්තක් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය විටකදී උපදේශාත්මක සභා, කමිටු හෝ උපකමිටු පත් කිරීමට ද බලය ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම

**5.** (1) සංස්ථාවේ කටයුතු, සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව, තෝරා පත් කරගනු ලබන හය දෙනකුට නොවැඩි සාමාජික සංඛ්‍යාවකගෙන් සමන්විත වූ කළමනාකරණ කමිටුවක් විසින් මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව, කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) සාමාජිකයකුගේ නාමයෝජනා කිරීමේ හෝ නිලවරණයේ හෝ කිසියම් දෝෂයක් නිසා සහ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් පැවතීම යන හේතු මත පමණක් කළමනාකරණ කමිටුවේ ක්‍රියාවක් හෝ ක්‍රියාපටිපාටියක් හෝ අවලංගු වූවා සේ නොසැලකිය යුතු ය.

(3) සංස්ථවේ ප්‍රථම කළමනාකරණ කමිටුව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ පීඨයේ කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු අතර, එම කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්, මෙම පනතේ 6 වැනි වගන්තිය යටතේ සාදන ලද රීතිවලට අනුකූලව නව කළමනාකරණ කමිටුවක් තෝරා පත් කරන තෙක් ධුර දැරිය යුත්තේ ය.

සංස්ථාවේ රීති

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ නෙරපීම;

(ආ) ධුර දරන්නන් තෝරා පත් කර ගැනීම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුරය හිස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ වගකීම;

(ඇ) කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කරගැනීම සහ එහි බලතල, කාර්ය, චර්යාව සහ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගේ ධුර කාලයන්;

(ඈ) සංස්ථාවේ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන්ගේ චර්යාව, කාර්ය, කර්තව්‍ය සහ බලතල;

(ඉ) කළමනාකරණ කමිටුවේ රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, කාලවේලාවන්, ස්ථානයන්, එම රැස්වීම පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, එම රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී සාකච්ඡා කළ යුතු කාරණා;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම සහ එහි අරමුදල්වල භාරකාරත්වය, ගිණුම් පවත්වාගෙන යාම සහ එහි විගණනය; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) (1) වැනි උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයටම සහ එවැනිම වූ රැස්වීමක දී සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, එකතු කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත්විය යුතු ය.

සංස්ථාවේ සාමාජිකයන්ගේ නාමලේඛනය

7. කළමනාකරණ කමිටුවේ ලේකම්වරයා විසින් සංස්ථාවේ සාමාජිකයන්ගේ සාමාජික නාම ලේඛනයක් නඩත්තු කළ යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරීම

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙහිලා බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපළ මේ පනතේ විධිවිධාන සහ සංස්ථාවේ 6 වැනි වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ ඒ දේපළ අන්‍යාකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාවේ අරමුදල

9. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, ප්‍රදාන, පරිත්‍යාග හෝ ආධාර මුදල් වශයෙන් මින් පෙර හෝ මින් මතු ලැබෙන සියලු මුදල් සංස්ථාවේ අරමුදල් වෙනුවෙන් කළමනාකරණ කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි එක් බැංකුවක හෝ බැංකු වැඩි සංඛ්‍යාවක, සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ දේපළ වැඩිදියුණු කිරීම, සංවර්ධනය කිරීම හෝ පුනරුත්ථාපනය කිරීමේ අරමුණු සඳහා සංස්ථාව විසින් ක්ෂය හෝ නිදන් අරමුදලක් පිහිටුවිය හැකි ය.

(3) සංස්ථාවෙහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේදී සංස්ථාව විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

**පීඨය විසින් ගෙවිය යුතු සහ පීඨයට අයවිය යුතු ණය**

**10.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි පීඨයේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පීඨයට අයවිය යුතු සියලු ණය සහ පීඨය වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම**

**11.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ වගකීම් බේරුම් කිරීම හෝ වෙනත් යම් කාර්යයක් සඳහා එවැනි සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජිකත්ව ගාස්තුව ඉක්මවා යම් සම්මාදමක් කිරීමට යටත් නොවිය යුතු ය.

**ගිණුම් සහ විගණනය**

**12.** (1) සංස්ථාව විසින් එහි ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ සංස්ථවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ “සුදුසුකම් ලත් විගණකවරයා” යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් සේවයෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද,

ගණකාධිකාරීවරයකු වශයෙන් සේවයෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව

13. සභාපති/කළමනාකාර අධ්‍යක්ෂවරයා හා ලේකම්වරයා හෝ කළමනාකරණ කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි සංස්ථාවේ වෙනත් සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී සාමාජිකයන් විසින් ඔවුන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් සාධන පත්‍රයෙහි ඔවුන්ගේ නම් අත්සන් කළ යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ

14. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හැරීමේදී හෝ එසේ කිරීමට පෙර හෝ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් විසින් එවැනි ආයතනයන් තීරණය කළ යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

15. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

16. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.